**උක් පර්යේෂණ ආයතනය - 2013**

උක් පර්යේෂණ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 75 දරන උක් පර්යේෂණ පනතේ 19 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට උක් පර්යේෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** **ප්‍රමිති අංක 02**

(i) මුදල්, මුදල් හා සමාන අයිතම ලෙස දැක්විය හැක්කේ මාස 03 ක් හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන කෙටි කාලීන ද්‍රවශීල වත්කම් වුවද ආයතනය විසින් රු.37,600,383 ක් වන ස්ථාවර තැන්පතු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල්, මුදල් හා සමාන අයිතම ලෙස දක්වා තිබුණි.

(ii) පාරිතෝෂික වශයෙන් ගෙවා තිබුණු රු.2,571,702 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වෙනම දැක්විය යුතු වුවත් එය මූල්‍ය ක්‍රියාකාරකම්වලට අදාළව මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි.

**(ආ)** **ප්‍රමිති අංක 03**

සමාලෝචිත වර්ෂය දක්වා ආයතනයේ සෙස් බදු ආදායම් ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය “මුදල් පදනම” වුවද සමාලෝචිත වර්ෂයේ දී සෙස් බදු ආදායම් ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය ආනයනය කරන ලද සීනි සඳහා මුදල් පදනම මතද දේශීය සීනි නිෂ්පාදනය උපචිත පදනම මතද ලෙස වෙනස්කර තිබූ නමුත් මේ පිළිබඳ ගිණුම්වල හෙළිදරව් කර නොතිබූ අතර, ගිණුම් ප්‍රතිපත්තියක් වෙනස් කරන්නේ නම් අතීතයානුයෝගී ව්‍යවහාරය අනුව එම වෙනස් වීම ගිණුම්ගත කළ යුතු බව දක්වා තිබුණද ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු රු.367,875 ක ජීව විද්‍යාත්මක වත්කම් මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා ගිණුම් සටහන් යටතේ අනාවරණය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ මුළු පොළී ආදායම රු.18,511,906 ක් වුවද අවසන් ගිණුම්වල රු.20,444,601 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,932,695 ක පොළී ආදායමක් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.20,940,000 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතය සමාලෝචිත වර්ෂයේදී වෙන්ව හඳුනා නොගෙන පොදු සංචිත යටතේ දක්වා තිබුණි.

(ආ) සීනි සමාගමකට සපයන ලද උක්දඩු වෙනුවෙන් රු.1,022,500 ක මුදලක් ලැබිය යුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ලැබිය යුතු වටිනාකම රු.361,845 ක් වූයෙන් රු.660,665 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනසට හේතුන් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ණය ගැති කාල විශ්ලේෂණයට අනුව මුළු ණයගැති ශේෂය රු.11,576,680 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.14,374,932 ක් වූයෙන් වෙනස රු.2,798,252 ක වෙනසක් දක්නට ලැබුණි.

(ii) සීනි සමාගමකින් අයවිය යුතු රු.1,000,000 ක මුදලක් වර්ෂ 03 කට අධික කාලයක සිට අයවිය යුතුව පැවතියද එය ණය ගැති කාලවිශ්ලේෂණයේ දක්වා නොතිබුණි. තවද, ණයගැතියන්ගෙන් රු.6,765,668 ක් අවු.03 කට වඩා වැඩිකාලයක සිටද, රු.1,012,094 ක් අවු.04 කට වඩා වැඩි කාලයක සිටද අයවිය යුතුව පැවතුණි. මෙම ණය මුදල් ආපසු අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ණයහිමියන්ගෙන් රු.683,271 ක් වූ ශේෂයක් අවු.02 ට වඩා වැඩි කාලයක සිට පියවීමකින් තොරව පැවතුණි.

(ii) ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ශේෂය රු.181,250 ක් වුවත් කාල විශ්ලේෂණයෙහි එකතුව රු.126,750 ක් ලෙස දක්වා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.28,875,134 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,900,416 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.20,974,718 ක වැඩිවීමට සෙස් ආදායම රු.6,500,921 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.17,452,051 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය වියදම්, මූල්‍ය වියදම් හා නඩත්තු වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 65 ක්, සියයට 594 ක් හා සියයට 29 ක් වශයෙන් වැඩි වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම් පූර්ව වර්ෂයට සාපේක්ෂව සියයට 82 කින් වැඩි වී තිබුණි. පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු ට්‍රැක්ටර් සඳහා ගෙවිය යුතු රු.7,800,000 ක් ඇතුළත් වීම මෙම වැඩිවීමට බලපා තිබුණි.

**3.3 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

ආයතනයේ සේවකයෙකු විසින් ඔහු සේවයෙන් පහ කිරීමට විරුද්ධව ආයතනයට එරෙහිව අධිකරණයෙහි නඩුවක් ගොනුකර තිබුණද එය ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශීය සීනි නිෂ්පාදකයින් විසින් නිපදවනු ලබන සෑම සීනි කිලෝග්‍රෑම් එකකටම ශත 10 ක් බැගින් වූ සෙස් බද්දක් අයකළ යුතු බවට ලබා දී තිබූ නියෝගය අනුව සීනි නිෂ්පාදනය කරනු ලබන දේශීය නිෂ්පාදන ආයතන තුනකින් 2012 වර්ෂයට අදාළව රු.3,382,688 ක සෙස් බදු මුදලක් ලැබීමට තිබූ අතර, සමාලෝචිත වර්ෂයට අදාළව එම ආයතනය විසින් නිෂ්පාදනය කර තිබූ සීනි සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන සෙස් බදු මුදල ගණනය කර අයකර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථිර කොන්ත්‍රාත් සහ අනියම් පදනම මත කම්කරු ශ්‍රමිකයින් 112 ක් සිටියදී බීජ උක් ව්‍යාපෘතිය වෙනුවෙන් ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ට අදාළව ගොවි සංවිධානයකින් කම්කරු ශ්‍රම ඒකක 7,681 ක් ලබාගෙන ඒ සඳහා රු.5,952,775 ක් ගෙවා තිබුණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 209 ක් වූ අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 168 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන ජ්‍යෙෂ්ඨ, තෘතීයික, ද්විතීයික තනතුරු පිළිවෙලින් 04 ක්, 09 ක්, 10 ක් හා ප්‍රාථමික මට්ටමේ 18 ක් පුරප්පාඩුව පැවතිණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) සෙස් ආදායම් රැස්කිරීම
(ඇ) ගබඩාකරණය